# තැපැල් දෙපාර්තමේන්තුව

## තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර නිර්මාණකරණය සඳහා නිර්මාණකරුවන් ලියාපදිංචි කිරීම. - 2010

තැපැල් දෙපාර්තමේන්තුව සිය ආදායම් එකතු කර ගැනීමේ මූලිකතම මාර්ගයක් ලෙස මුද්දර භාවිතා කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ තැපැල් ආදායම් එකතු කර ගැනීම සඳහාත්, විනෝදාංශයක් ලෙස මුද්දර එකතු කරන්නන් සඳහාත් ඉලක්ක කර මුද්දර නිර්මාණය කරනු ලබන අතර, රාජ්‍ය ආදායම එකතු කිරීමේ මාර්ගයක් ලෙස ද මුද්දර භාවිතා කෙරේ. මේ ලෙසම විදේශ තැපැල් අධිකාරීන් විසින් ද මුද්දර නිකුත් කරනු ලබන අතර ජාත්‍යන්තර වෙළඳපොළේදී දේශීය මුද්දර මෙම විදේශ මුද්දර සමඟ තරඟකාරී සැසඳීමකට ලක් වේ. එම නිසා දේශීය මුද්දර ඉහළ නිර්මාණශීලී ගුණාත්මකතාවයකින් යුක්තව විශේෂයෙන් ශ්‍රී ලාංකික අනන්‍යතාවයකින් යුතුව ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය දැඩිව සාකච්ඡාවට භාජනය වී ඇත.

මෙම සියලු කාරණා හේතුවෙන්, තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර නිර්මාණකරුවන් සංචිතය ශක්තිමත් කිරීමට තීරණය කර ඇති අතර, ඒ සඳහා පහත මූලික සුදුසුකම්වලින් යුතු නිර්මාණකරණයේ යෙදෙන පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත.

**මූලික සුදුසුකම් :-**

01. මුද්දර නිර්මාණකරණයේ කැපවීමකින් යුතුව නිරත වීමට කැමැත්තක් දැක්වීම.
02. චිත්‍ර කර්මය පිළිබඳ මනා හැකියාවකින් යුතු වීම.
03. චිත්‍ර කර්මය පිළිබඳ අධ්‍යාපනයක් ලබා තිබීම.
04. චිත්‍ර කර්මය පිළිබඳ දේශීය හා විදේශීය තරඟවලින් ජයග්‍රහණය ලබා තිබීම හා සහභාගිත්වය

මෙම සියලු සුදුසුකම් අතරින් මෙම කාර්යයට ඇති කැමැත්ත, කැපවීම හා නිර්මාණශීලී ලෙස චිත්‍ර කර්මයේ යෙදීමට ඇති හැකියාව ප්‍රමුඛතම සුදුසුකම් වේ. මේ නිසා මෙම මූලික සුදුසුකම් ඇති නිර්මාණකරුවන් මෙම කාර්යය සඳහා ඉදිරිපත් වී තම හැකියාවන් ප්‍රයෝජනවත් ලෙස යෙදවීමට එක්වන ලෙස මෙමගින් ආරාධනය කරමි. විශේෂයෙන් පාසල් හා උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන චිත්‍ර කර්මයේ දක්ෂතා දක්වන නිර්මාණශීලී සිසු දරු දැරියන් සඳහා මෙම අවස්ථාව තම නිර්මාණ දිවියේ අනාගත සාර්ථකත්වය උදෙසා මහඟු පිටුවහලක් වනු ඇති අතර, ඔවුන්ගේ ඉදිරිපත් වීම ඉතා අගය කොට සලකමි.

මෙම කාර්යයේදී නිර්මාණකරණයේ යෙදීම මත පදනම්ව උපදේශක දීමනාවක් ගෙවනු ලබන අතර නිර්මාණ දක්ෂතා ඔප් නැංවීමේ වැඩසටහන් ද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන නිර්මාණකරුවන්, තම අයදුම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ආකෘති පත්‍ර තැපැල් දෙපාර්තමේන්තු මූලස්ථාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයට පැමිණ හෝ www.slpost.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දුරකථන අංක 011-5746194 ඇමතීමෙන් හෝ ප්‍රසම්පාදන කළමනාකරණ අංශයට පැමිණ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) හමුවීමෙන් ලබාගත හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පත්‍ර 2009.12.15 දිනට පෙර ලැබෙන සේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, පළමු මහල, තැපැල් මූලස්ථානය, 310, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10. යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට හැකිය.

එම්.කේ.බී. දිසානායක<br>
තැපැල්පති<br>
තැපැල් මූලස්ථානය,<br>
310, ඩී.ආර්.විජේවර්ධන මාවත,<br>
කොළඹ 01000.<br>
2009.10.19

# තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර නිර්මාණ කටයුතු සඳහා නිර්මාණකරුවන් ලියාපදිංචි කිරීම. - 2010

## - කොන්දේසි පත්‍රය -

තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර නිර්මාණ කටයුතු සඳහා නිර්මාණකරුවෙකු ලෙස අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා පහත කොන්දේසි අදාළ වේ.

01. මුද්දර නිර්මාණකරුවන් ලෙස ලියාපදිංචි කිරීම ඊට අදාළව කිසිදු ලෙසකින් දෙපාර්තමේන්තුවේ ස්ථිර හෝ තාවකාලික තනතුරක් සඳහා බඳවා ගැනීමක් හෝ අනුයුක්ත කිරීමක් නොවන අතර හුදු උපදේශාත්මක සේවා ලබා ගැනීම සඳහා ලියාපදිංචි කර ගැනීමක් පමණක් වේ.

02. නිර්මාණකරුවන් ලෙස ලියාපදිංචි කර සකස් කරනු ලබන ලියාපදිංචි ලේඛනයත් යම් මුද්දරයක් සඳහා නිර්මාණ කැඳවීමේදී නිර්මාණකරුවන් තෝරා ගැනීමේ බලයත් තැපැල්පති සතු වේ.

03. මුද්දරයක් නිර්මාණය කිරීමේදී ලියාපදිංචි නිර්මාණකරුවන් පස් දෙනෙකුගෙන් නිර්මාණ කැඳවනු ලබන අතර, තැපැල්පති විසින් පත් කරනු ලබන නිලධාරීන් තුන් දෙනෙකුගෙන් යුත් කමිටුවක් විසින් නිර්මාණ මූලික වශයෙන් තේරීම සිදු කරනු ලබයි.

04. මුද්දර සඳහා නිර්මාණ ඉදිරිපත් කරනු ලබන සෑම නිර්මාණකරුවෙකු සඳහාම රු. 2,000.00ක ගාස්තුවක් එම නිර්මාණය වෙනුවෙන් දරන ලද වියදම් පියවීම සඳහා දෙපාර්තමේන්තුව ගෙවනු ලබයි. ඊට අමතරව තෝරාගනු ලබන නිර්මාණය සඳහා රු.10,000.00ක උපදේශාත්මක සේවා ගාස්තුවක් ගෙවනු ලැබේ.

05. යම් මුද්දරයක් නිර්මාණය කිරීමේදී එහි ගුණාත්මක බව ආරක්ෂා කිරීමේ පියවරක් ලෙස නිර්මාණකරුවන් කමිටුවක් ලෙස නිර්මාණය කිරීමට තීරණය කළහොත් එම කමිටුවේ සෑම සාමාජිකයෙක් සඳහාම රු.5,000.00ක උපදේශාත්මක සේවා ගාස්තුවක් ගෙවනු ලැබේ.

06. යම් මුද්දරයක් සම්බන්ධයෙන් සම්බන්ධ වන සෑම නිර්මාණකරුවෙකු සඳහාම තම කාර්යය භාරය අනුව ඒ සම්බන්ධයෙන් වූ සහතික පත් නිකුත් කරනු ඇත.

07. සෑම ලියාපදිංචි නිර්මාණකරුවෙකු සඳහාම දෙපාර්තමේන්තුව නිකුත් කරනු ලබන සෑම මුද්දරයක් වෙනුවෙන්ම මුල්දින කවරයක්, මුද්දර සටහන් පත්‍රයක් අදාළ මුද්දරය ද ඇතුළත්ව නිකුත් කරනු ලැබේ.

08. පිළිගත හැකි කරුණු ඉදිරිපත් කිරීමකින් තොරව, තමන්ට නිර්මාණ ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් අවස්ථාවලදී නිර්මාණ ඉදිරිපත් නොකරන නිර්මාණකරුවෙකු සිටියහොත් එම නිර්මාණකරු පූර්ව දැනුම් දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කරනු ඇත.

09. නිර්මාණකරුවන් තමන්ට ලබාදෙන කාල රාමුව තුළ එම නිර්මාණ ඉදිරිපත් කිරීමට විශේෂයෙන් සැලකිල්ලක් දැක්විය යුතුය. නිර්මාණ ඉදිරිපත් කිරීමේදී දුර්වල ප්‍රතිචාරයක් දක්වනු ලබන නිර්මාණකරුවන්ගේ නම් ලියාපදිංචි නාම ලේඛනයෙන් පූර්ව දැනුම්දීමකින් තොරව කපා හරිනු ඇත.

10. නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණකරණයේදී ස්ථාන පරීක්ෂාව සඳහා අවශ්‍ය පහසුකම් හා වියදම් තැපැල් දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන අතර තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරී මහතෙකු ඊට අදාළ අනෙකුත් කටයුතු සංවිධානය කරනු ලබයි. කාන්තා නිර්මාණකරුවන් සඳහා එහිදී අවශ්‍ය වන්නේ නම් අතිරේක වශයෙන් විශ්වාසවන්තයෙකු සහභාගි කරගැනීමට ද අවස්ථාව සලසනු ලැබේ.

11. නිර්මාණකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන් කාලීනව දෙපාර්තමේන්තුව සංවිධානය කරනු ලබන අතර සාධාරණ හේතු දැක්වීමකින් තොරව එවැනි වැඩසටහන් සඳහා සහභාගී වීමට අපොහොසත් වන නිර්මාණකරුවන් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

එම්. කේ. බී. දිසානායක
තැපැල්පති

තැපැල්පති,

තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර නිර්මාණ කටයුතු සඳහා නිර්මාණකරුවන් ලියාපදිංචි කිරීම - 2010 සඳහා මවිසින් අයදුම් කරනු ලබන්නේ ඉහත අංක 01 සිට 11 දක්වා කොන්දේසි පත්‍රය කියවා හොඳාකාරව තේරුම් ගෙන බව සහතික කරමි.

තවද, මුද්දර නිර්මාණ කටයුතු සඳහා ලියාපදිංචි ලේඛනයේ හෝ ඉන් පරිබාහිරව පුද්ගලයන් තෝරා ගැනීමේ සම්පූර්ණ බලය තැපැල්පති සතු වන බව මා හොඳාකාරව අවබෝධ කරගෙන සිටින අතර, ඉහත කොන්දේසිවලට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් පූර්ව දැනුම් දීමකින් තොරව, නාම ලේඛනයෙන් නම කපා හැරීමට ද මා වෙනුවෙන් ඇතිවන පුරප්පාඩුව සඳහා හෝ අමතර වශයෙන් එකම අවස්ථාවක වෙනත් නිර්මාණකරුවෙකු ඇතුළත් කරවීමේ බලය තැපැල්පති සතු වන බව ද මා හොඳාකාරව දන්නා බව තහවුරු කොට ප්‍රකාශ කරමි.

අත්සන :- ................................................

නම :- ........................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය :- ............................................................................

## තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර නිර්මාණ කටයුතු සඳහා නිර්මාණකරුවන් ලියාපදිංචි කිරීම. - 2010

### ජීව දත්ත පත්‍රය

1. සම්පූර්ණ නම :-

2. ජාතික හැඳුනුම්පත් අංකය :-

3. ලිපිනය :-

4. දුරකථන අංකය :- (i) නිවස :-

(ii) ජංගම :-

5. ඊ - මේල් :-

6. නිර්මාණකරණ හැකියාව :-

7. විශේෂ හැකියාවක් දක්වන ක්ෂේත්‍රය :-

8. උසස් අධ්‍යාපන සුදුසුකම් :-

9. ජාතික වශයෙන් ලබා ඇති විෂයානුබද්ධ සුදුසුකම් :-

10. ජාත්‍යන්තර වශයෙන් ලබා ඇති විෂයානුබද්ධ සුදුසුකම් :-

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය :- ..............................................

..................................................

අත්සන